# කොන්දක් ඇති කොල්ලෝ

**සහන් කසීර වික්‍රමසිංහ**



ඉතිහාසය නොදන්නා කෙළතොල්ලන් කෙලෙස අර්ථ ගැන්වූවද ඉතිහාසය නැවත නැවතත් ප්‍රති නිර්මාණය පවතී.

යෞවන නාට්‍ය සම්මාන උළෙලේ දී සුරින් චාමර සහ කසුන් චතුරංග තරුණ කලාකරුවන් දෙදෙනා උදය ගම්මන්පිල අතින් සම්මාන ලැබීම ප්‍රතික්ෂේප කිරීම උණුසුම් මාතෘකාවක් වී ඇත. මේ විරෝධය කෙටිකාලීන ජනප්‍රියත්වය උදෙසා බවත් , අඩුම ගණනේ ගම්මන්පිල තරමට වත් මේ කලාකරුවන් ජනප්‍රිය නොවන බවත් බුද්ධිමතුන්ගේ අවධානයට ලක් ව ඇත. එය ඉඳුරාම සත්‍යයකි. සුරින් චාමර සහ කසුන් චතුරංගට වඩා වෙලේ සුදා, කොණ්ඩයා සහ ආනමාලූ ඉම්ටියාස් වැන්න වුන් ද ලංකාවේ ජනප්‍රිය ය.

1984 වසරේ තරුණ සේවා සභාව විසින් පවත්වන ලද යෞවන සම්මාන උළෙලේ හොඳම ගීත නිබන්ධනය වෙනුවෙන් සම්මාන හිමි වුඉයේ සුනන්දා රණසිංහට ය. ඒ මොහොතේ සම්මාන පිරිනමන්නට වේදිකාව ඇරියුම් කරන්නේ බර්නඩීන් රෝස් සේනානායක හෙවත් රෝසි සේනානායකට ය. 1980 වසරේ ලක් රූ රැජණ වූයේද 1981 වසරේ ආසියා පැසිපික් ජාත්‍යන්තර රූ රැජණ ව සිටියේ ද රෝසි සේනානායක ය. සුනන්දා රණසිංහ වේදිකාවට නැගී රෝසි අතින් සම්මානය ලබා නොගෙන ප්‍රේක්ෂකයින්ට ආචාර කර හිස් අතින් වේදිකාවෙන් බසින්නීය. රෝසි සේනානායකව ලොවම දන්නා බවත් සුනන්දා රණසිංහව කිසිවෙක් නොදන්නා බවත් එදා මෙන්ම අදත් කෙනෙකුට පවසන්නට හැකිය. නමුත් එදා 1984 වසරේ සුනන්දාට යෞවන සම්මානය හිමි වූයේ හොඳම කැට් වෝක් සඳහා හෝ ජවි කල්‍යාණය සඳහා නොවම බැවින් සුනන්දා ගත් තීරණය සෘජු ය. අනම්‍යය ය. එමෙන්ම එදා හොඳම ගීත නිබන්ධනය වෙනුවෙන් සම්මාන පිරිනමන්නට වේදිකාවට නැගි රෝසි සේනානායක අද දක්වා ලංකාවේ සාහිත්‍ය වෙනුවෙන් දායාද කළ කිසිවක් නැත. මියා කලීෆා , සනී ලියෝන් තරම් ජනප්‍රිය නොවුණද සුනන්දා රණසිංහ සහ ඇගේ කවි ද, තැනිතලා බිමක සිහින ඉම වැනි රාජ්‍ය සම්මානයට නිර් දේශ වූ කාව්‍ය කෘති පිළිබඳ ද දන්නෝ පමණක් දනිති.

සුරින් චාමර සහ කසුන් චතුරංග ගැන ද කියන්නට ඇත්තේ එයම ය. බාගදා ඔවුන් මාතර පිහි හරඹ පෙන්නූ සිසුවා මෙන් රටම දන්නා පුද්ගලයන් විය නොහැකිය. නමුත් එදා විසි හය හැවිරිදි සුනන්දා මෙන්ම ඔවුන් ප්‍රතිපත්තිගරුක, කශේරුකාවක් සහිත ජීවිතයකට ඇලූම් කරන බව පෙනී යයි.

**මිත්‍රවරුනි**
**ප්‍රතිපත්තිගරුක, කශේරුකාවක් සහිත ජීවිතයක් සහ උදය ගම්මන්පිලගේ ජීවිතය යන විකල්ප දෙක අතරින් ඔබ තෝරා ගන්නේ කුමක්ද ?**



# "මහමෙර සේ" සමඟ "ළා හිරු රැස්" මෛත්‍රීගෙන්



**සිසිර දිසානායක**

## පසුගිය කළපය හා බැඳෙයි

සංගීත තැටි යුග්මයේ අඩංගු ගීත සයක්ම සංගීතවත් කරන්නේ ඉන්ද්‍රජිත් මිරිහාන තරුණ සංගීතවේදියාණන්. මහාචාර්ය සනත් නන්දසිරි ප්‍රවිණ

සංගීතවේදියාණන් ගයන "දෙදහස් හයසිය", "සයුර වී" මෙන්ම රෝහණ සිරිවර්ධනයන් ගයන "ගිලී ගිය අතීතේ" නලින් තමෙල් ගයන "කඩයිමේ හිඳ" සහ විශාරද ජගත් වික්‍රමසිංහයන් ගයන "උදු ගරේ ගී " ඒ අතරට එක් වෙයි. තේමා ගීතය වන "මහමෙර සේ" ගීතයේ සංගීත නිර්මාණය ද ඉන්ද්‍රජිත් මිරිහා නයන් ගේ වන අතර ගායනය දුලිප් ජය කොඩිගෙනි. තේමා ගීතයද පියා අමතන පුතෙකුගෙනි. මේ එකතුවේදී මෛත්‍රී පණාගොඩ නිබන්ධකයාණන් සිය සෙනෙහස පිළිබඳව වඩාත් සංවේදී වී ඇති සේය.



"ඔබටයි මේ බැති කැකුල" ජස්ටින් ගාල්ලගේ විසින් තනුව නිර්මාණය කරගෙන ගැයු මව් ගුණ ගීයකි. අරුණ කන්නංගර සංගීතය නිර්මාණය කර ප්‍රදීප් වාස් ගුණවර්ධන ගැයු "පෙරුම් පුරාගෙන" ගීයක් පින් පිරිමට කල් මදි වීමෙන් පසු තැවෙන්නෙකුගේ පාපෝච්චාරණයකි. අරුණ තමාරා කන් නංගර සමඟ ගැයු "සමනොළ ගිර" ගීය ද ඔහුගේම සංගීතයෙන් ගී සමුච්චය අගට එක් වෙයි. මෙල්රෝයි ධර්මරත්න නිර්මාණය කළ සංගීතය අනුව ලලිත් කළුපහන ගයන "ඈත දුරක" සහ "සාදු හදවතේ" ගීතත් ශ්‍රී ලාල් පෙරේරා ගයන "වැහි බීරිමේ" ගීයත් "මහමෙර සේ" ගී එකතුවේ තවත් අගනා ගීත තුනකි. ප්‍රසාදිකා වික්‍රමරාච්චි ගයන "මහවැලියේ පෙන බුබුලක" විශාරද නලීන් ජිතේන්ද්‍ර අල්විස්ගේ සංගීතයෙන් හැඩ වී ඇත්තේය. අරුණ තමෙල්ගේ සංගීතයට නලීන් තමෙල් ගැයු "අඩ අඳුරේ" ගීතයක් අග්‍රා ප්‍රේමරත්නගේ සංගීතයට සචිත්ත පනගොඩ පුතනුවන් ගැයු ගීයත් ගී එකතුවට එක්වන අනෙක් මිහිරි ගීතයි.



"ළා හිරු රැස්" ළමා ගීත එකතු වට ගී 14 ක් ගොනු වී ඇති අතර, සියල්ල ඉන්ද්‍රජිත් මිරිහාන ශිල්පියාණන්ගේ මිහිරි තනු හා සංගීත රටාවලින් හැඩ වෙයි. විශාරද අනුරාධා නන්දසිරි සංගීතාචාර්යාවරියගේ "ගන්ධාරි" කලායතනයේ දෙනුරි නිහන්සා, සචිනි හිමාෂා, නදුනි කාවින්ද්‍යා, යෙහෙන් බොතේජු, දේශප් ගුණවර්ධන, අක්සෙන් නානායක්කාර යන දූ පුතුන්ගේ ගායනාවන්ගෙන් එය හැඩ වෙයි. විවිධ මාතෘකා ඔස්සේ යමින් අපගේ මතු පරපුර වෙනුවෙන් මෛත්‍රී පනාගොඩ ගී පද නිබන්ධකයාණන්ගේ පෑන් තුඩ වෙහෙසී ඇති අන්දම ඉන්ද්‍රජිත් මිරිහානයන්ගේ සුරතල් බව කැටි වුණ සංගීත රටා අතරින් සවනට දැනෙනා විට ඇති වන්නේ මහත් සතුටකි. වැඩිහිටියන්ට වඩාත් සුදුසු ගී ගයමින් දරු පරපුර "කුරුවල්" මානසිකත්වයට පත්වන මෙවන් වකවානුවක නැවුම් ළමා ගී පෙළක් නිර්මාණය වීමත්, එළි දැක්වීමත් සැබැවින්ම අගැයිමට ලක් විය යුතුයි.

අධිනිතීඥ මෛත්‍රී පනාගොඩ ගී පද නිබන්ධකයාණන්ගේ මේ උත්සහය වාණිජත්වයෙන් මිදුණ අවංක උත්සහයක් බව වෙසෙසින් නො කිව මනාය. ඉතින් ඒ උත්සහයට අපගේ ලෙංගතු සුභපැතුම් එක් කරන්නේ මතු වටත් මෙවන් නිර්මාණ වැඩි වැඩියෙන් එළි දැක්වීමට දිරිය, සවිය සහ නිරෝගී බව ලැබේවා ය යන්න ඉත සිතින් ම පතමින්.